විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය
தலைமுறையொன்றின் பெருமிதம்
Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. PEN/IT/2020/PENSION APPOINMENT
ඔබේ අංකය / உமது இல. / Your No. ....
දිනය / திகதி / Date 2020/06/ 11

ප්‍රාදේශීය ලේකම් මඟින්,
සියළුම විශ්‍රාම වැටුප් නිලධාරීන්/සංවර්ධන නිලධාරීන්,

<u>පවතින කොරෝනා වසංගත තත්වය මත විශ්‍රාමිකයින්ගේ ගැටළු විසඳීම</u>

ජනාධිපති ලේකම්ගේ පීඑස්/සීඑස්ඒ/චක්‍රලේක/14/2020 හා 2020.03.19 දිනැති චක්‍රලේකය අනුව, කොවිඩ් - 19 වසංගතය රට තුළ පැතිර යාමත් සමඟ සංචාරය සීමා කෙරුණු කාල සීමාව තුලදී වැඩිම අවධානමක් පැවති රටේ ජ්‍යෙෂ්ඨ පුරවැසි ප්‍රජාව නියෝජනය කරන විශ්‍රාමිකයින් සඳහා සුවිශේෂී මෙහෙවරක් ප්‍රාදේශීය මට්ටමින් ඉටු කිරීම සම්බන්ධව ස්තුති වන්ත වෙමි.

02.ඉදිරි අවදානම් කාල සීමාව තුළදී ද සියලු විශ්‍රාමිකයින්ගේ හා සේවා ලාභීන්ගේ සෞඛ්‍ය ආරක්ෂිත භාවය උපරිම අන්දමින් තහවුරු වන ලෙස ප්‍රාදේශීය මට්ටමින් සේවාවන් පවත්වාගෙන යාම සඳහා ඔබ සියලු දෙනාගේ සහාය අපේක්ෂා කරමි.

03.මේ වන විට රටෙහි පවතින කොරෝනා වසංගත තත්වය මත වැඩිහිටි විශ්‍රාමික ප්‍රජාවට සහ විශ්‍රාම වැටුප් අයදුම්කරුවන්ට සිය විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර පිළිබඳ විමසීම හා විශ්‍රාම වැටුප් සම්බන්ධ විමසීම් සිදු කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සැකසීමේ අවශ්‍යතාවය මතු වී ඇත. ඒ අනුව විශ්‍රාමිකයින් හා විශ්‍රාම වැටුප් අපේක්ෂකයින් හෝ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් සපයන සේවාවන් ලැබීමට බලාපොරොත්තුවෙන් සිටින පිරිසගේ ගැටලු සම්බන්ධයෙන් ප්‍රාදේශීය මට්ටමින් උපරිම වශයෙන් සේවය සැලසීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල විශ්‍රාම වැටුප් අංශ මඟින් කටයුතු තවදුරටත් සිදු කළ යුතුව ඇත.

04.දැනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් සපයන බොහෝමයක් සේවාවන් මාර්ගගත ක්‍රමය යටතේ ක්‍රියාත්මක වන අතර ඕනෑම අයෙකුට තම අපේක්ෂිත සේවා සම්බන්ධ තොරතුරු පරීක්ෂා කිරීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හරහා අවස්ථාව සලසා දී ඇත.

05.මීට අමතරව විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධව සියලු තොරතුරුද DS Portal යටතේ පරීක්ෂා කළ හැක. ඒ අනුව යම් පුද්ගලයකු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සේවා සම්බන්ධයෙන් තොරතුරු විමසීමකදී එම පුද්ගලයාගේ <u>අනන්‍යතාව තහවුරු</u> කරගෙන අවශ්‍ය සේවාවන් සපයන ලෙස කාරුණිකව දන්වමි.

මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

06.එසේම, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට දෛනිකව පැමිණෙන පිරිස සීමා කිරීමට සහ සැම දෙනාගේම සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු වන පරිදි කළමනාකරණය කිරීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට පැමිණීමට පෙර වේලාවක් වෙන් කරවා ගැනීමට අවශ්‍ය පහසුකම් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා මහජනතාව වෙත සලසා ඇත.මෙයට අමතරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පැමිණ විසඳුම් ලබා දීමට අපොහොසත් වූ පිරිස් සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත පැමිණීමට දිනයක් වෙන් කර දීමට සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත pms පද්ධතිය හරහා පහසුකම් සපයා ඇත. (පද්ධතිය භාවිතා කරන ආකාරය ඇමුණුම මඟින් දක්වා ඇත.)

07.ඒ අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සියලුම සේවා ලාභීන් වෙත ප්‍රාදේශීය මට්ටමින් උපරිම සේවාවක් ලබා දීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වන අතර අත්‍යවශ්‍යම කරුණක් සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කිරීමට අපේක්ෂා කරන පිරිස් සඳහා පමණක් ඉහත සඳහන් කරන ලද පරිදි දිනයක් වෙන් කර ගැනීමේ පද්ධතිය භාවිතා කර දිනයක් හා වේලාවක් වෙන් කර දීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

ඒ.ජගත් ඩී.ඩයස්

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

01.විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වෙත පිවිස ‘PENSION MANAGEMENT SYSTEM’ මත Click කරන්න.



02. එවිට පහත අතුරු මුහුණත දිස් වේ.එහි PD 03 මත Click කරන්න. pms සඳහා ඇති භාවිත ගිණුම හා මුර පදය භාවිතා කර පද්ධතිය තුළට පිවිසිය හැක.



03. එවිට පහත අතුරු මුහුණත දිස්වේ. එහි Pension Appoinment මත Click කරන්න



04.එවිට පහත අතුරු මුහුණත දිස්වේ. එහි ‘type’ එක select කරන්න. Type එක pensioner ලෙස select කළ යුත්තේ දැනට විශ්‍රාම වැටුපක් ලබන විශ්‍රාමිකයින්ය. එසේ නොවන පුද්ගලයින් ‘Non Pensioner’ select කරන්න



- ඉහත රූපයෙහි දැක්වෙන ලෙස pensioner select කර ජාතික හැඳුනුම් පත් අංකය ඇතුලත් කළ විට ඔබගේ නම හා දුරකථන අංකය Auto fill වේ.

- ‘Non Pensioner’ select කර ජාතික හැඳුනුම් පත් අංකය ඇතුලත් කළ විට අදාල පුද්ගලයා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ යම් කිසි පද්ධතියක ලියාපදිංචි වී ඇත්නම් ඔහුගේ නම හා දුරකථන අංකය Auto fill වේ.එසේ නොමැති නම් ඔබට අදාල දත්තයන් ඇතුලත් කිරීමට හැකියාව පවතී.
- විශ්‍රාම වැටුප් අංකය හෝ යොමු අංකයක් පවතී නම් එය ඇතුලත් කරන්න.
- ඔබගේ ගැටළුවට අදාල ශාඛාව තෝරන්න.
- ඔබගේ ගැටළුව ඇතුලත් කරන්න.
- ඔබට අවශ්‍ය දිනය select කරන්න.
- ඔබට අවශ්‍ය වේලාව select කරන්න.
- Submit කරන්න.

06. ඔබ විසින් ලබා දී ඇති දුරකථන අංකයට ඔබ පැමිණිය යුතු වේලාව හා දිනය සඳහන් කරමින් කෙටි පණිවිඩයක් ලැබෙනු ඇත.

.